# සංක්ෂිප්තය

පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී පාසල් මුහුණ දෙන ගැටලු හා බාධක හඳුනා ගනිමින් එම ගැටලු හා බාධක අවම කිරීම උදෙසා පාසලට සමීපතම පරිපාලන ආයතනය ලෙස කලාප අධ්‍යාපන කාර්යාලයට කෙසේ මැදිහත් විය හැකිද යන්න හඳුනා ගැනීම සඳහා කරන ලද සමීක්ෂණාත්මක පර්යේෂණය සඳහා දෙනුවර අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය පාසල් 68 ක විදුහල්පතිවරුන් 68 දෙනකු අරමුණුගත නියැදිකරණයට අනුව තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී පාසල් මුහුණ දෙන ගැටලු හා බාධාවන් හඳුනා ගනිමින් එම ගැටලු හා බාධාවන් අවම කිරීම උදෙසා පාසලට සමීපතම ආයතනය ලෙස කලාප අධ්‍යාපන කාර්යාලයට කෙසේ මැදිහත් විය හැකිද යන්න විමසා බැලීමත් එම ගැටලු හා බාධාවන් අවම කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලයට ලබා දිය හැකි විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීමත්ය. මෙහිදි භාෂාව බාධාවක් වන හෙයින් අධ්‍යයනයේ පහසුව සඳහා සිංහල මාධ්‍ය පාසල් පමණක් තෝරා ගන්නා ලදි. අරමුණු ඉටුවන පරිදි ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා ලිඛිත මූලාශ්‍ර යන දත්ත රැස්කිරීමේ ක්‍රම ශිල්ප යටතේ දත්ත රැස්කරන ලද අතර එම දත්ත ප්‍රමාණාත්මක ක්‍රම ශිල්ප උපයෝගි කර ගනිමින් විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණයට අදාළව පූර්වයෙන් කළ දේශිය හා විදේශීය පර්යේෂණ අධ්‍යයනයේදි පාසල් පාදක ගුරු සංර්ධනය පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කර ඇති බව හඳුනාගත හැකිවිය. එමෙන්ම එම දත්ත ඇසුරෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත. එම පර්යේෂණ නිගමනයන්ද අවබෝධ කර ගනිමින් සහ පාසල්, කලාප කාර්යාල ඇසුරෙන් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා තුළින් නියැදියෙන් රැස් කරන ලද දත්ත විශ්ලේෂණයෙන් ලබාගත් නිගමනයන්ගෙන් ගම්‍ය වන්නේ පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පතිවරුන් මෙන්ම සහභාගිවන්නන් ලෙස ගුරුවරුන්ටද ගැටලු පවත්නා බවත් එම ගැටලු අවම කර ගැනීම උදෙසා පාසලට සමීපතම පරිපාලන ආයතනය වශයෙන් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලැබෙන්නා වූ සහාය ප්‍රමාණවත් නොවන බවත්ය. මෙහිදි පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පාසල් මුහුණ දෙන ගැටලු අවම කිරීම උදෙසා කලාප අධ්‍යාපන කාර්යාලයේ දායකත්වය ඉහළ නැංවීම උදෙසා කලාප කාර්යාල මට්ටමෙන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම, පාසල් අතර සම්පත් හා විශිෂ්ඨ ව්‍යවහාර හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා දිරිගැන්වීමේ වැඩසටහන් අත්‍යවශ්‍ය බව පර්යේෂණයේදි අනාවරණය විය.

# Abstract

The purpose of the study is to find out how far the Zonal Education Office, the closet administrative unit to schools contributes in planning and conducting school Based Teacher Development Programme, in identifying the problems and issues faced by the schools in the process and in providing necessary assistance and guidance to overcome these obstacles. Principles of 68 Sinhala Medium schools were selected for the study, based on the purposive sampling technique. Different methods have been adopted to collect primary and secondary data needed for the study, and data analysis has been done using quantitative methods. Conclusions and proposals made by the previous researchers in the field have assisted and guided the researcher. After analyzing the collected data it has been identified that the contribution made by the ZEO to make the aforesaid programme a success is not at a satisfactory level. So, possible recommendations have been proposed to make the programme more successful and to enhance the role played by the ZEO in the process.